# සාරාංශය

මනුෂ්‍ය ශිෂ්ටාචාරය ආරම්භ වන්නේ ගංගා නිම්න මුල්කරගෙනය. මිසරයේ නයිල්, චීනයේ හොවැංහෝ, මෙසපොතේමියාවේ යුප්‍රටීස් - ටයිග්‍රිස් වැනි ගංගා නිම්න මානව ශිෂ්ටාචාරයේ මුල් බිම් ලෙස සැලකේ. ශ්‍රී ලංකාවේ ද කිරිඳි ඔය, කලා ඔය, මහවැලි ගඟ, මල්වතු ඔය ආදී ජල මූලාශ්‍ර ආශ්‍රිතව මෙරට ආර්ය ජනාවාස ව්‍යාප්ත වූ බව අප හොඳින් දන්නා කරුණකි. මෙරට මානව සංස්කෘතිය ව්‍යාප්ත වූයේ මෙවැනි ගංගා නිම්න ආශ්‍රිතවය (රත්නපාල, 1993). කළු ගංගාව ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ගංගාවක් වන හෙයින් මෙම ගංගාව ආශ්‍රිතවද මෙවැනි ලක්ෂණ විද්‍යමාන වේදැයි විමසා බැලීමට මෙහිදී අවධානය යොමු කරන ලදී.

පහළ කළු ගං නිම්නය ආශ්‍රිත ප්‍රදේශයේ පවතින ස්පර්ශනීය හා නස්පර්ශනීය උරුමයන් මොනවාද එම උරුමයන් ව්‍යාප්ත වීමේ ස්වරූපය කුමක් ද යන්න හඳුනා ගැනීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදී. පහළ කළු ගං නිම්නයේ පුරාවිද්‍යාත්මක ස්ථාන හා උරුමයන් පිළිබඳව වාර්තා කිරීම, උරුමයන් ව්‍යාප්ත වී ඇති රටාව හා උරුමයන්හි ස්වභාවය අනුව පැරණි සමාජයීය, ආර්ථික, සංස්කෘතික තත්වයන් පිළිබඳ අධ්‍යයනය කිරීම සහ ප්‍රදේශය ආශ්‍රිත පාරිසරික ලක්ෂණ හඳුනා ගැනීම පර්යේෂණ අරමුණු අතරට එක් වේ. මෙම අධ්‍යයන සඳහා මූලික පර්යේෂණ ක්‍රමවේද දෙකක් භාවිතා විය. පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර සහ සාහිත්‍යය මූලාශ්‍ර මගින් තොරතුරු ලබා ගැනීම යන ක්‍රමවේදයන් යොදා ගන්නා ලදී. පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර මගින් තොරතුරු ලබා ගැනීමට ක්ෂේත්‍ර ගවේෂණය සිදු කළ අතර මතුපිට ගවේෂණය මගින් තොරතුරු රැස් කරන ලදී. වාර්තාගත නොවූ පුරාවිද්‍යා උරුමයන් හඳුනා ගැනීම ගවේෂණයේ මූලික අරමුණ වූ අතර, දැනට හඳුනාගෙන ඇති හා මෙතෙක් නිසි ලෙස වාර්තාගත වී නොමැති පුරාවිද්‍යා ස්ථාන වෙත ගොස් මූලාශ්‍රයන්හි සඳහන් කරුණු සමග සසදා බැලීම, එම කරුණු තහවුරු කරගැනීම හා නිසිපරිදි වාර්තාගත කිරීම සිදුකරන ලදී. මේ සඳහා සම්මුඛ සාකච්ඡා වැනි ක්‍රියාමාර්ග ද යොදා ගැණින. මූලාශ්‍ර පරිහරණය යටතේ මහාවංශය, දීපවංශය, බෝධිවංශය වැනි ප්‍රාථමික මූලාශ්‍රයන්හි හා ද්විතීයික මූලාශ්‍රයන්හි ඇතුළත් තොරතුරු අධ්‍යයන ක්‍රමවේදයක් ලෙස යොදා ගන්නා ලදී.

ප්‍රාග් ඓතිහාසික යුගය නියෝජනය කරන සාධක මෙතෙක් පහළ කළු ගං නිම්නය තුළින් වාර්තා වී නොමැත. නමුත් මධ්‍ය කළු ගං නිම්නය තුළින් මෙම සාධක වාර්තා වන හෙයින් අනාගත පුළුල් පුරාවිද්‍යා පර්යේෂණ තුළින් මෙම සාධක වාර්තාවීමේ වැඩි අවකාශයක් පවතී. ඓතිහාසික අවධිය හා සම්බන්ධ තොරතුරු අධ්‍යයනයේ දී හඳුනාගත හැකි වූ අතර මෙම සාධක මගින් ඉතා දීර්ඝ ජන සංස්කෘතියක් මෙහි ව්‍යාප්තව පැවති බව ගම්‍ය වේ. ඓතිහාසික හා පශ්චාත් ඓතිහාසික යුගයන්ට අයත් ස්මාරක, ශිලා ලිපි හා සංකේත බලකොටු ආදී සාධක පිළිබඳ තොරතුරු අනාවරණය කරගත හැකිවිය.

අගුළු පද

කළුගඟ - නිම්නය - පුරාවිද්‍යාත්මක - උරුමය - ප්‍රදේශය

## Summary

Human civilization commences in the river valley areas such first civilizations areas are nile-china,hovanho,upretis in mesopothemia etc are regarded as the first human civilization areas.In srilanka too kirindi oya,mahaweli ganga,malwathu oya are the beginning areas of first human civilizations.kaluganga is one of the main and significant river valley area and it plays an important role in civilization and colonization.

The research study has been done to find out whether there are tangible and intangible heritage and what sort of are those and the nature of those.the objectives of the research are to find out the heritage,nature of them,expansion and economic,cultural positions of the ancient human communities.further the objectives of the research studies reveal the characteristics of the environment and the settlement land areas.archaeological based informations and literary based informations are those methods.identification of unreported informations visiting the particular areas and thereby comparing with the fundamental informations.confirming those informations and reporting them interviewing people also has been carriedout to make there credible and authentic preliminary.primary literary informations and secondery literary informations were used as research methods.

There are no pre historic proofs so far in lower kalu ganga river area.but there are proofs reported in the middle kalu ganga river area.there will be many proofs found out in the future archaeological researchs.when getting in to history there are many proofs identificable that there were a long period of human culture of civilization existed.there are monuments,inscriptions and symbols, portraits found and proofs there belong to historic and post historic periods.



**Key words**

River Kalu ganga - Valley - Archaeological - Heritage - Area